*PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 14-Iss. II, Dec. 2023, 44-57.*
DOI: https://doi.org/10.4038/p.v14i2.47

# කටුපොත මෙගලිතික සුසාන කැණීමෙන් හමු වූ පබළු පිළිබඳ මූලික විමර්ශනයක්

# [A Priliminary Investigation on Beads Found at the Katupotha Megalithic Burial Excavation]

**Radawane Sirisumangala**[1]
**Alexsender Kapukotuwa**[2]
**Oshan Wedage**[3]

**Abstract**

Katupotha megalithic burial site is located in the Dematamalgama Grama niladari divison of the wilachchiya Divisional Secretariat in the Anuradhapura District of the North Central Province. This is the first excavation based on the megalithic burial site in the lower Malwatu Oya basin. Data from two burials are used for this research. The bones were used for chronology associated with burials. The sequence from burials comprise 2 dates, from older than 2290BP to 2260BP. An excellent series of beads was found from excavations, evidence have been used for early Iron Age technology and social stratification with considerable effectiveness.

**Keywords:** Megalithic Cultural, Burial Site, Beads, Technology, Social Stratification, Dating

1 Senoir Lecturer, Department of Sociol Sinceses and Comparative Studies, Bkiksu University of Sri Lanka.

E-mail: sirisumsngala80@gmail.com

2 Department of History and Archacology, University of Sri Jayewardenepura.

3 Department of History and Archacology, University of Sri Jayewardenepura.

Received: 22 August 2023, Accepted revised version: 30 October 2023.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

### හැඳින්වීම

පබළු හෙවත් ඉංග්‍රීසි භාෂාවේ Bead යනු විවිධ හැඩයෙන් හා වර්ණයෙන් යුතු නූලක් දැමීම සඳහා සිදුරු කර තිබෙන කුඩා ප්‍රමාණයේ භාණ්ඩයක් ලෙස අර්ථ දක්වා ඇත. මෙය එම නූල උපයෝගී කොටගෙන බෙල්ලේ බඳින, ආභරණයක් (necklace) අතේ බඳින ආභරණයක් (bracelets) පටියක් හෝ වළලක් (belt) ලෙස භාවිත කරණ දෙයක් වැනි යමක් සඳහා යොදාගැනේ (Encyclopeadia Americana, 1978: 394). මේවා ප්‍රාග් ඓතිහාසික යුගයේ සිටම ලොව විවිධ ජන සමාජවල භාවිත කර තිබේ. ලෝකයේ බොහෝ පුරාවිද්‍යාත්මක ස්ථාන වලින් හමුවී ඇති සාධකවලට අනුව වීදුරු, ගල්, කොරල්, මැණික්, සිප්පිකටු හා දැව යන අමුද්‍රව්‍යය යොදාගෙන පබළු නිර්මාණය කොට තිබේ. මෙම පර්යේෂණය උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, දෙමටමල්ගම ග්‍රාමසේවා වසමේ පිහිටි කටුපොත මෙගලිතික සුසානය ආශ්‍රිතව සිදු කළ පර්යේෂණ කැණීමෙන් ලබා ගත් පබළු ඇසුරෙන් සිදු කෙරේ (සිතියම අංක 01). පූර්ව ඓතිහාසික යුගයේ පැවති සාමාජීය තත්වය, පබළු නිෂ්පාදන තාක්‍ෂණය සහ සුසාන චාරිත්‍ර පිළිබඳව අධ්‍යයනය කිරිමේ දී මෙම පබළු එකතුව අගනා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් වේ.

මෙම සුසානය ආශ්‍රිතව මතුපිට භූමියේ සුසාන ස්මාරකවලට අයත් සාධක නිරීක්‍ෂණය වූයේ ඉතා සුළු වශයෙනි. එහෙත් කාලයත් සමග පසින් යට වූ සොහොන් ස්මාරක අතිවිශාල ප්‍රමාණයක් ඇති බව පර්යේෂණ කැණීම සිදුකිරීමේ දී හමු වූ පුරාවිද්‍යාත්මක දත්ත වලින් තහවුරු වේ. යෝජිත ප්‍රධාන සුසාන ස්මාරකය කැණීම් කිරීමේ දී එහි පැති ගල් හතරට සම්බන්ධ සිව් දිශාවන්ට විහිදී යන තවත් සුසාන ස්මාරකවලට අයත් සාධක හමුවිය. ඒ අනුව කැණීම් කටයුතු සඳහා භාජනය වූයේ සොහොන් ස්මාරක තුනක් පමණි. එම ස්මාරක අංක 01-02- සහ 03 යනුවෙන් නම් කළේය. අංක 01 සුසාන ස්මාරකය අනෙක් සුසාන ස්මාරක දෙකට වඩා ප්‍රමාණාත්මක සහ නිර්මාණාත්මක වශයෙන් වෙනස්කම් දක්නට ලැබේ. තවද මෙහි තැන්පත් කොට තිබූ සුසාන ද්‍රව්‍යයන්ගේ විවිධතා කිහිපයක් නිරීක්‍ෂණය විය. මියගිය පුද්ගලයා ආදාහනය කිරීමෙන් පසු ශේෂ වූ භෂ්මාවශේෂ මැටි බඳුනක දමා සුසාන ස්මාරක මධ්‍යයේ තැන්පත්කොට ඇත. මෙලෙස භෂ්මාවශේෂ තැන්පත් කිරීමේ දී ආහාර පාන අනුභව කිරීම සඳහා භාවිතා කරන විවිධ වර්ගයේ මැටි බඳුන් සහ පබළු වර්ග අඩු වැඩි වශයෙන් තැන්පත් කොට තිබුණි. මෙම ද්‍රව්‍යාත්මක සාධක පූර්ව ඓතිහාසික යුගයේ මානව ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීමේ දී අගනා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් වේ.

### සාහිත්‍යය විමර්ශනය

ශ්‍රී ලංකාවේ මෙතෙක් සිදුකොට ඇති පුරාවිද්‍යාත්මක පර්යේෂණවලට අනුව පළඳනා නිර්මාණය සහ භාවිතය පිළිබඳ සාධක මධ්‍ය ශිලා යුගයට අයත් ස්ථාන වලින් වාර්තා වී තිබේ (Perera, 2010: 185). මේ අතුරින් පාහියංගල, කුරුවිට බටදොඹ ලෙන, කිතුල්ගල සහ අලවල පොත් ගුල් ලෙන යන ස්ථාන ඉතා වැදගත් වේ (Ibid). පළඳනා නිර්මාණය කිරීම සඳහා මුහුදු බෙලි කටු වර්ග මොර දත් අමුද්‍රව්‍ය වශයෙන් භාවිත කොට ඇත (Adikari at al. 2009: 16-17). මෙම අමු ද්‍රව්‍යය භාවිතයෙන් පළඳනා නිර්මාණය කිරීමෙන් ලද කුසලතාවයේ තවත් ඉදිරි පියවරක් වශයෙන් ප්‍රාග් ඓතිහාසික අවධියේ මානවයාගේ පබළු නිර්මාණයන් පෙන්වාදිය හැකිය. ප්‍රාග් ඓතිහාසික අවධියේ මානවයා විසින් මුහුදු බෙල්ලන් උපයෝගීකොට ගෙන පබළු නිර්මාණය කළ බවට සාධක මධ්‍යය ශිලා යුගයට අයත් ස්ථාන වලින් බහුල වශයෙන් තොරතුරු හමුවී ඇත (Deraniyagala, 2007: 53). කුරුවිට බටදොඹ ලෙන ආශ්‍රිතව 1980-82

වර්ෂවලදී සිදු කළ පර්යේෂණ කැණීම් වලදී අදින් වසර 37000-15000 අතර වූ කාලයට අයත් 6-7 ස්ථර වලින් සිප්පි කටු උපයෝගී කොට ගෙන පබළු නිර්මාණය කොටගෙන භාවිත කළ බවට ද්‍රව්‍යාත්මක සාධක හමුවී ඇත (Perera, 2010: 185). 2009 වර්ෂයේ දී පාහියන් ලෙන ආශ්‍රිතව සිදු කළ පර්යේෂණ කැණීම් තුළින් ද අදින් වසර 38000 පැරණි යුගයේ ජීවත් වූ මානවයා භාවිත කළ පබළු පුරාවිද්‍යාඥයින් විසින් සොයාගෙන ඇත (Perera, 2010: 184-186).

පබළු නිෂ්පාදනය සහ භාවිතය පිළිබඳ ඉතා ක්‍රමවත් පැහැදිලි සාධක මූල ඓතිහාසික සංස්කෘතියට අයත් සුසාන ආශ්‍රිතව හමු වේ. මෙම අවධිය වන විට ඛනිජ සහ පාෂාණ වර්ග උපයෝගී කොටගෙන පබළු නිර්මාණය කොට තිබේ (Seneviratne, 1984: 237-305). අමුද්‍රව්‍යය තෝරා ගැනීම සහ නිෂ්පාදන තාක්ෂණයේ සුවිශේෂී නිපුණතාවක් මූල ඓතිහාසික සංස්කෘතිය තුළ දක්නට ලැබීම විශේෂත්වයකි. ඊජිප්තුවේ සහ මෙසපොතේමියාවේ ක්‍රි.පූ. 4000 දී පමණ සිට නව ශිලා යුගය දක්වා වූ කාල පරාසය තුළ පබළු භාවිත කොට ඇති බවට සාධක හමුවේ (Encyclopeadia Americana, 1978: 394).

ඓතිහාසික යුගය වන විට ශ්‍රී ලංකාවේ පබළු නිර්මාණ කර්මාන්ත ශාලා බොහෝමයක් පැවති බව පුරාවිද්‍යාත්මක පර්යේෂණ ඇසුරින් පෙන්වා දී ඇත (Hannibal, 2011: 203-294). ක්‍රි.පූ. හතරවන ශත වර්ෂයේ දී මෙගස්තිනිස් විසින් ඉන්දියාව සහ ලංකාව පිළිබඳ ඉදිරිපත්කොට ඇති විස්තර සටහන් වලට අනුව ඉන්දියාවෙන් හමුවන මුතුවලට වඩා විශාල මුතු ශ්‍රී ලංකාවෙන් හමුවන බව සඳහන් කරයි (පොන්නම්පෙරුම, 1961: 30). ක්‍රි.ව. පළමුවන සියවසේ ජීවත් වූවෙකු සේ සැලකෙන සොලීනස් පොලිහිස්ටර් නැමැත්තා ලංකාව පිළිබඳ දක්වා ඇති විස්තරයේ මෙරට මුතු බෙල්ලන් එක්රැස් කරන ආකාරය පිළිබඳව විස්තර කර තිබේ (එම: 37-38). මෙම කාලය වනවිට මුතු නිෂ්පාදනය කිරීම සම්බන්ධව ශ්‍රී ලංකාව ලෝකයේ ප්‍රසිද්ධියක් ලබා සිටි බව මින් පැහැදිලි වේ. දුටුගැමුණු රජු (ක්‍රි.පූ. 161-137) පබළු උපයෝගී කොටගෙන නිර්මාණය කරන ලද හිස් පළඳනාවක් පැළඳි බව ථූපවංශයේ සඳහන් වේ (ථූපවංසය, 1959: 32). තවද ලෝවාමහාපාය නිර්මාණය කිරීමෙන් පසු එහි මධ්‍යයේ වූ පාදුකාවක් පබළු වලින් අලංකාරවත් කොට ඇත (මහාවංසය, 27:36). දුටුගැමුණු රජු (ක්‍රි.පූ. 161-137) මහාථූපය නිර්මාණය කිරීමේ දී එහි අවශ්‍යයතාවයන් සඳහා පබළු සහ මුතු අනුරාධපුර නගරයට බටහිර දෙසින් පිහිටි උරුවෙල් දනව්ව ආශ්‍රිත මුහුදෙන් ගොඩ ගැසුණ බව සඳහන් වේ (මහාවංසය, 28:23). භාතිකාභය රජු (ක්‍රි.පූ. 22 ක්‍රි.ව 07) මහාථූපයේ සුණු පිරියම් කිරීම සඳහා මුතු භාවිත කළ අතර ඒ සඳහා මුතු ගැල් සීයයක් යොදා ගත් බව සඳහන් වේ (වංසත්ථප්පකාසිනී, 1994:5 06). මේ වන විට වයඹ දිග මුහුදු තීරය ආශ්‍රිතව මුතු කිමිදීම බහුල වශයෙන් සිදු කොට ඇති අයුරු උක්ත කරුණු වලින් තහවුරු වේ. කොරල් මූලික අමුද්‍රව්‍යය වශයෙන් යොදාගෙන නිර්මාණය කරන ලද පබළු 06ක් කටුපොත මෙගලිතික සුසාන පර්යේෂණ කැණීමෙන් ද හමු විය. ඒ අනුව පූර්ව ඓතිහාසික යුගයේ පටන් පහළ මල්වතුඔය නිම්නය ආශ්‍රිතව ජීවත් වූ මානවයා පබළු නිර්මාණය කිරීම සඳහා මූලික අමුද්‍රව්‍යයක් වශයෙන් කොරල් වර්ග යොදාගෙන ඇති බව මින් පැහැදිලි වේ. භාතිකාභය රජු (ක්‍රි.පූ. 22 ක්‍රි.ව 07) මහා ථූපයට සිදු කළ විශේෂ පබළු පූජාවක් පිළිබඳ විස්තර මහාවංසයේ දැක්වේ (මහාවංසය, 34: 46-47). ඒ අනුව රජු රෝමයට දූතයන් යවා ගෙන්වාගත් රත් පැහැති පබළු විශේෂයකින් නිර්මාණය කළ පබළු දැලින් මහාථූපය ආවරණය කොට, එම සුවිශේෂී පුද පූජාව සිදු කොට ඇත. (වංසත්ථප්පකාසිනී, 1994: 507). අනුරාධපුර යුගයේ දී දෙස් විදෙස් පබළු වර්ග සහ මුතු විවිධ ආගමික අවශ්‍යයතාවයන් සඳහා යොදාගෙන ඇති අයුරු මින් පැහැදිලි

වේ. ආගමික අවශ්‍යතාවයන් උදෙසා භාවිත කළ පබළු පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක අභයගිරිය, ජේතවනාරාමය සහ මහා විහාරය යන පුරාවිද්‍යා පරිශ්‍රතුළින් විශාල වශයෙන් සොයාගෙන තිබේ. ජේතවනය පරිශ්‍රයෙන් පමණක් දෙස් විදෙස් පබළු වර්ග තුන් ලක්ෂ පනස් දහසකට ආසන්න ප්‍රමාණයක් මේවන විට සොයාගෙන තිබේ (මැන්දිස්, 2019: 238). අනුරාධපුර සමාජයේ පබළු නිර්මාණය සහ භාවිතයේ ස්වාභාවය වටහාගැනීම සඳහා ජේතවනාරාම පබළු එකතුව කදිම නිදසුනකි. ක්‍රි.පූ 800 තරම් ඈත යුගයේ සිටම අනුරාධපුර ඇතුල් නගරය ආශ්‍රිතව පබළු නිෂ්පාදනය සහ භාවිතය පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක හමුවන බව එස්.යූ. දැරණියගල මහතා වැඩි දුරටත් පෙන්වා දී ඇත (Deraniyagala, 1974:48-169). බුත්සරණෙහි විපස්සනා ඥාණය විස්තර කරමින් සිරුරේ ඇති නිෂ්ඵල බව පබළු වැනි වටිනා දෙයකට සමාන කළ නොහැකි බව සඳහන් කරයි (බුත්සරණ, 1959: 29). මෙකල සමාජයේ පබළු සඳහා ඉහළ වටිනා කමක් තිබූ බව මින් පැහැදිලි වේ. මහනුවර යුගයට අයත් සිතුවම් පරීක්‍ෂා කිරීමෙන් තත් යුගයේ පබළු නිර්මාණ භාවිතය පිළිබඳ තොරතුරු හමුවේ. විශේෂයෙන් දේවරූපවල සහ කාන්තාවන්ගේ ඇඳුම් සැරසිලි නිර්මාණය කිරීමේ දී බහුල වශයෙන් පබළු භාවිත කොට ඇති අයුරු දක්නට ලැබේ (Bandaranayake, 1986: 195-199). ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් වර්තමානය දක්වාම විවිධ වූ අවශ්‍යතාවයන් සඳහා මානවයා විසින් පබළු භාවිත කොට තිබේ.

**පර්යේෂණ ගැටලුව**

මෙතෙක් සිදු කොට ඇති පුරාවිද්‍යාත්මක පර්යේෂණ වලට අනුව පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන කැණීම් වලදී තත් යුගයේ මානවයාගේ සුසාන චාරිත්‍ර පිළිබඳ තොරතුරු බොහොමයක් අනාවරණය කොටගෙන තිබේ. එම චාරිත්‍රවලදී විවිධ වර්ග වලට අයත් පබළු අඩු වැඩි වශයෙන් භාවිත කළ බවට පුරාවිද්‍යාත්මක තොරතුරු හමු වී ඇත. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ සුසාන තුළ මිහිදන් කළ සුසාන ද්‍රව්‍යය අතර පබළු තැන්පත් කිරීමේ උපයෝගීතාවය කුමක්ද? යන්න සොයා බැලීම මෙහි පර්යේෂණ ගැටලුවයි.

**පර්යේෂණ අරමුණ**

කටුපොත මෙගලිතික සුසාන පර්යේෂණ කැණීමෙන් හමුවූ පබළු වල ප්‍රමාණයෙන්, හැඩයෙන් හා අමුද්‍රව්‍යයන්ගේ විවිධතා කිහිපයක් නිරීක්ෂණය විය. එම විවිධතා ඇසුරින් මෙම සුසාන අයත්වන සමාජයේ මානව ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

**ක්‍රමවේදය**

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය මගින් 2019 වර්ෂයේ දී උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 367 දෙමටමල්ගම ග්‍රාමයේ පිහිටි කටුපොත මෙගලිතික සුසානයේ උතුරු අක්ෂාංශ 08.36606 N නැගෙනහිර දේශාංශ 80.14816E අතර පිහිටි සොහොන් ස්මාරකය කැණීම් කළේය. මෙම සොහොන් ස්මාරකය කැණීම් කිරීමේ දී මෙහි උතුරු පැතිගගට යාබදව තවත් සුසාන ස්මාරක දෙකකට අයත් පුරාවිද්‍යාත්මක සාධක හමුවිය. ඒ අනුව මෙම සුසාන ස්මාරක පිළිවෙළින් අංක 1,2,3 යනුවෙන් අංකනය කළේය. ප්ලානම් ක්‍රමවේදය යටතේ පස් ඉවත් කරමින් සුසාන ද්‍රව්‍යයන් අනාවරණය කරගන්නා ලදි. මෙසේ අනාවරණය කරගත් මැටි බඳුන්වල සහ ඉන් පිටත විසිරී තිබී සොයාගත් පබළු අතුරින් පබළු හැටක් මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලද අතර මේවා වර්ගීකරණය කිරීම සඳහා බෙක් වර්ගීකරණ ක්‍රමය (Beak Classification System) භාවිත කෙරේ (Beak, 1928). තවද පබළු නිර්මාණයකොට ඇති තාක්‍ෂණය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් මෙම අධ්‍යයනය සිදු කළ අතර පබළු

විශ්ලේෂණය කිරීමේ දී මිණුම් ලබා ගැනීම සඳහා ඩිජිටල් තරාදිය සහ ඩිජිටල් කැලිබර් යන මෙවලම් භාවිත කරමින් බෙක් විසින් ඉදිරිපත්කොට ඇති මිණුම් ලබාගැනීමේ ක්‍රමවේදය භාවිත කළේය (Beak, 1928:3). පුස්තකාල ගවේෂණය ඇසුරෙන් පූර්ව පර්යේෂණ පිළිබඳ අධ්‍යයනය කරන ලදි.

**සාකච්ඡාව**

කටුපොත මෙගලිතික සුසාන පර්යේෂණ කැණීමේ දී සුසාන ස්මාරක තුනක් කැණීම් කළේය. මින් සුසාන ස්මාරක දෙකකට අදාළව පමණක් කාබන් කාලනිර්ණ වාර්තා ලබාගැනීමට හැකි විය. කාලනිර්ණය කිරීම සඳහා අස්ථි නියැදි යොදාගත් අතර අංක 02 සුසානයේ කාලනිර්ණය කිරීම සඳහා ප්‍රමාණවත් වූ තරම් අස්ථි නියැදි නොතිබූ හෙයින් එම සුසානය සඳහා කාබන් කාලනිර්ණය කිරීමට නොහැකි විය. මෙම සොහොන් ස්මාරකයෙන් වීදුරු පබළු පනහකට අධික ප්‍රමාණයක් හමු වුවද එම පබළු මෙම පර්යේෂණය සඳහා භාවිත නොකෙරේ. කාබන් කාලනිර්ණය සහිත අංක 01 සහ 03 යන සුසාන ස්මාරකවලින් ලබා ගත් පබළු පමණක් මෙම පර්යේෂණය සඳහා භාවිත කළේය. ඒ අනුව දේශීය සහ විදේශීය යන දෙවර්ගයේම අමුද්‍රව්‍යය භාවිත කරමින් නිෂ්පාදනය කරන ලද පබළු අසූ අටක් අංක 01 සහ 03 යන සුසාන ස්මාරක තුළින් සොයා ගැනීමට හැකි විය. මේ අතුරින් තෝරාගත් පබළු හැටක ප්‍රමාණයක් මෙම පර්යේෂණය සඳහා යොදා ගැනේ. මේවා විනිවිද පෙනෙන තිරුවානා, වීදුරු, සත්ව කොටස්, කානේලියන් සහ ඇගේට් යන අමුද්‍රව්‍යය භාවිත කරමින් නිෂ්පාදනය කර ඇති බව තහවුරු විය. මෙම පබළු නිර්මාණය කිරීම සඳහා වූ නිෂ්පාදන තාක්ෂණික ක්‍රම හතරක් අනුගමනය කොට ඇති බව මූලික පරීක්ෂණ වලින් පැහැදිලි වේ.

01. ඇදීමේ ක්‍රමය Drawn Techniqe

02. එතීමේ ක්‍රමය Wound Techniqe

03. පීඩන ක්‍රමය Fresher Techniqe

04. කැපීමේ ක්‍රමය Cutting Techniqe

අංක 01 සුසාන ස්මාරකයෙන් වීදුරු පබළු (Glass Beed) විශාල ප්‍රමාණයක් සුසාන ද්‍රව්‍යය තැන්පත්කොට තිබූ ප්‍රධාන මැටි බඳුනේ තිබී සොයාගැනීමට හැකි විය. මේවා නිෂ්පාදනය කිරීම සඳහා ඇදීමේ (Drawn) සහ එතීමේ (Wound) ක්‍රමය භාවිත කොට ඇත. ලෝකයේ බොහෝ ඓතිහාසික ස්ථාන වලින් හමුවන වීදුරු පබළු නිෂ්පාදනය කිරීම සඳහා මෙම තාක්ෂණික ක්‍රමවේදය භාවිත කොට තිබේ (Francis, 2002: 129-140). මෙහි දී උණු කරන ලද වීදුරු නල ලෙස සකසා ගැනීමෙන් පසුව අවශ්‍යය ඝණකම අනුව කැපීම සිදු කොට ගෙන තිබේ. ඛනිජ වර්ග උපයෝගී කොට ගෙන පබළු නිෂ්පාදනය කිරීමේ දී ප්‍රධාන වශයෙන් කැපීමේ ක්‍රමය (Cutting Techniqe) සහ පීඩන ක්‍රමය (Fresher Techniqe) භාවිත කරමින් උචිත හැඩය ලබා ගත් පසු ඒ සඳහා වූ නිමාව ලබා ගැනීම සඳහා මැදීමේ ක්‍රමය භාවිත කොට ඇති බව තත් පබළු පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වේ. තිස්සමහාරාමයෙන් සොයාගත් ඉපැරණි පබළු පිළිබඳව පර්යේෂණ සිදු කළ හෙන්රි පාකර් පවසනුයේ පැරණි ශ්‍රී ලංකාවේ පබළු නිෂ්පාදනය සහ ඔපමට්ටම් කිරීමේ තාක්ෂණය ඉතා උසස් මට්ටමක පැවති බවය (පාකර්, 1984:61). කාර්නේලියන් පබළුවේ සුන්දර ආකෘතිය ලියවන පට්ටලයක ආධාරයෙන් පමණක් ලබා ගත හැක්කකි. එය වත්මන් වැඩ පලකින් නිෂ්පාදනය කර ගත්තා මෙන් අංග සම්පූර්ණ පැල්ලම් ඉවත්කරන ගලකින් ඉතා හොඳින් ඔපමට්ටම් කර තිබෙන බව පැවසේ (එමඃ 62). මෙම නිෂ්පාදන කුසලතාවයේ ආරම්භය පූර්ව ඓතිහාසික යුගය යැයි සිතිය හැකිය. පූර්ව බ්‍රාහ්මීය ශිලා ලේඛනවල මැණික් සහ රන් කරුවන් පිළිබඳව තොරතුරු සඳහන් වන අතර ඒවා මූලාශ්‍රය කොටගෙන සෙනරත් පරණවිතාන පවසනුයේ පබළු නිෂ්පාදන කටයුතු ද ඔවුන් යටතේ සිදුකෙරෙන්නට


ඇති බවය (Paranavithan, 1986: 117). ඓතිහාසික යුගය වනවිට ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම පාහේ ආගමික සහ ලෞකික අවශ්‍යතාවයන් සඳහා පබළු නිර්මාණය සහ භාවිතය පැවති බවට පුරාවිද්‍යාත්මක සාධක හමුවේ (Hannibal, 2011: 203-294). මෙම කාල පරිච්ඡේදය වන විට පබළු නිර්මාණය කිරීම සඳහා සුවිශේෂී දක්ෂතාවයන්ගෙන් පිරිපුන් ශිල්පීන් සිටි බව හමුවන පබළු වර්ග පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වේ.

කටුපොත මෙගලිතික සුසාන පර්යේෂණ කැණීමෙන් හමු වූ පබළු ඉහත සඳහන් තාක්ෂණික ක්‍රම ඔස්සේ නිෂ්පාදනය කොට ඇති අතර ඒවා ප්‍රධාන වශයෙන් ජ්‍යාමිතික හැඩ තල වලට අයත් වන බව මූලික විමර්ශන වලින් තහවුරු වේ. මෙම මූලික හැඩවලට අයත් උප හැඩයන් තුනකට අයත් වන පබළු මේ අතර දක්නට ලැබේ (සැලසුම් අංක 01 සහ ඡායාරූප 01).

01. රවුම් හැඩති පබළු (Circular beads)

02. පැති සහිත පබළු (Sides beads)

03. නැවුම් සහිත පබළු (Bend beads)



සැලසුම් අංක 01
සොහොන් ස්මාරකයන්ගෙන් හමු වූ
පබළු අයත්වන හැඩතල




ඡායාරූප අංක 01
සොහොන් ස්මාරකයන්ගෙන් හමු වූ
පබළු වර්ග

**01. රවුම් හැඩති පබළු (Circular beads)**

සිරස් හෝ තිරස් අතට රවුම් හැඩය සහිත පබළු මෙම වර්ගයට අයත් වේ. මෙම වර්ගයේ උප හැඩ පහකට අයත් පබළු කටුපොත මෙගලිතික සුසාන කැණීමෙන් හඳුනාගැනීමට හැකි විය. මේවා බෙක් පබළු වර්ගීකරණට අනුව උප කොටස් oH Rounded beads (Disc beads) කාණ්ඩ අංක 01 ට සමාන වේ.

**02. පැති සහිත පබළු (Sides beads)**

පැති කිහිපයකින් සමන්යුත පබළු මෙම වර්ගයට අයත් වේ. මෙම වර්ගයට අයත් උප හැඩ දෙකකට අයත් පබළු කටුපොත මෙගලිතික සුසාන කැණීමෙන් හඳුනාගැනීමට හැකිවිය. බෙක් පබළු වර්ගීකරණට අනුව උපකොටස් ii (Faceted beads ) කාණ්ඩ අංක iX,Xii ට සමාන වේ.

**03. නැවුම් සහිත පබළු (Bend beads)**

නැවුම් වලින් යුක්ත වීම හේතුකොටගෙන මෙනමින් පබළුව හැඳින්වේ. විවිධ නැවුම්

හැඩයන්ගෙන් යුක්ත පබළු අතීත මානවයා විසින් නිර්මාණයකොට භාවිතයට ගෙන තිබේ. කටුපොත මෙගලිතික සුසාන කැණීමෙන් මෙම වර්ගයට අයත් පබළු හමුවූයේ ඉතා සුළු වශයෙනි. මේවා පැති හයක් සහිත එක් නැවුමකින් යුක්ත වේ. බෙක් පබළු වර්ගීකරණට අනුව උපකොටස් ii (Faceted beads ) කාණ්ඩ අංක Xii ට සමාන වේ.

**සුසාන ස්මාරක වලින් හමුවූ පබළු වර්ග**

කටුපොත මෙගලිතික පර්යේෂණ සුසාන කැණීමෙන් කානේලියන්, වීදුරු, පැහැදිලි තිරුවානා සහ සිප්පි යන අමුද්‍රව්‍ය උපයෝගී කොටගෙන නිෂ්පාදනය කළ පබළු විශාල ප්‍රමාණයක් සොයාගැනීමට හැකිවිය. සමස්තයක් ලෙස මෙම පබළු එකතුවේ විවිධ පැහැයෙන් හා ප්‍රමාණයෙන් යුක්ත වීදුරු පබළු ප්‍රමාණයේ වැඩි වේ. ඒ අනුව වීදුරු පබළු නිෂ්පාදනය කිරීම සඳහා තත් යුගයේ ශිල්පීන් වැඩි නැඹුරුතාවයක් දක්වා ඇති බව හමු වූ පබළු එකතුව පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වේ. අංක 01 සුසානයෙන් හමු වූ පබළු දෙස බැලීමෙන් පෙනීයන්නේ එකල සමාජයේ වීදුරු පබළු නිර්මාණය බහුල වශයෙන් ජනප්‍රිය වී පැවති බවය. මේ සඳහා බලපෑ හේතු සාධක මොනවාද යන්න ස්ථිරවම කිව නොහැකිය. ඇතැම්විට වීදුරු පබළු නිෂ්පාදනය සඳහා වූ මූලික අමුද්‍රව්‍ය සපයාගැනීමේ පහසුව සහ නිෂ්පාදන ක්‍රියාවලියේ ඇති පහසුව මේ සඳහා හේතුවන්නට ඇතැයි සිතිය හැකිය. කානේලියන්, ඇගේට් වැනි විවිධ පාෂාණමය වර්ග සොයා ගැනීම මෙන්ම ඉන් පබළුවක් නිර්මාණය කිරීම සඳහා දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුවීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමෙන් පෙනී යන්නේ වීදුරු පබළු නිෂ්පාදනය වඩාත් පහසු වන බවය. මෙම කරුණු කෙරෙහි සැලකිලිමත් වූ ශිල්පීන් ඒ සඳහා උචිත වන අයුරින් පළදනා සැලසුම් කරන්නට ඇත. විශේෂයෙන් පාෂාණමය දිගැටි පබළුවේ සිදුර සැකසීම සඳහා මහත් පරිශ්‍රමයක් දරා ඇති බව ඒවා පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වේ. මෙවැනි දුෂ්කරතාවයන්ට විසඳුමක් ලෙස වීදුරු පබළු නිෂ්පාදනය සහ භාවිතය ප්‍රචලිත වන්නට ඇතැයි සිතිය හැකිය.

අංක 01 සහ 03 යන සුසාන ස්මාරක වලින් සොයාගන්නා ලද පබළු ප්‍රමාණය (වගු අංක 01) පිළිබඳව සැලකිලිමත් වීමෙන් පෙනී යන්නේ අංක 01 සුසාන ස්මාරකයෙන් හමු වූ පබළු ගෙල පලදනාවකට අයත් පබළු බවය. මෙම සෑම පබළුවක්ම නූලක් වැනි යමක් දැමිය හැකිවනසේ සිදුරුකොට ඇත. එසේ සිදුරුකර ඇති ආකාරය (සිරස් හෝ තිරස්) මෙන්ම පබළුවල ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳ විමර්ශනය කිරීමෙන් පෙනීයන්නේ ද මෙවා ගෙල පළදනාවකට අයත් පබළු සේ සැළකීම වඩාත් සුදුසු බවය. අංක 01 සුසාන ස්මාරකයෙන් සොයාගන්නා ලද පබළු ප්‍රමාණය සහ ඒවා සිදුරුකොට ඇති අයුරු පිළිබඳව සැලකිලිමත් වීමෙන් පැහැදිලි වනුයේ ඒවා අත් පළදනාවකට අයත් පබළු බවය.

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| කානේලියන් Carnelian | 03 |
| පැහැදිලි තිරුවානා Clear quartz | 03 |
| වීදුරු Glass | 45 |
| කොරල් | 06 |
| එකතුව | 57 |

වගු අංක 01

අංක 01 සොහොන් ස්මාරකයෙන් හඳුනාගත් පබළු වර්ග

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| කානේලියන් Carnelian | 02 |
| ඇගේට් | 01 |
| එකතුව | 03 |

වගු අංක 02

අංක 03 සොහොන් ස්මාරකයෙන් හඳුනාගත් පබළු වර්ග

සුසාන ස්මාරකය අභ්‍යන්තරයේ භෂ්මාවශේෂ තැන්පත් කළ ප්‍රදාන මැටි බඳුනේ භෂ්මාවශේෂ කොටස්, විවිධ වර්ගයේ මැටි බඳුන් යම් ප්‍රමාණයක් සහ විවිධ වර්ගයේ පබළු තැන්පත්කොට තිබුණි. සොහොන් ස්මාරකය නිර්මාණය කළ මුල් අවස්ථාවේදීම තැන්පත් කළ ද්‍රව්‍ය වශයෙන් මේවා හඳුනාගත හැකිය. අංක 03 සොහොන් ස්මාරකයෙන් සොයාගත් ප්‍රදාන සොහොන් ද්‍රව්‍ය තැන්පත් කළ බඳුන සහ එහි අභ්‍යන්තරයේ තැන්පත් කොට තිබූ දෑ සියල්ලම සුසාන ස්මාරකය නිර්මාණය කළ කාලයේ දී තැන්පත් කළ දෑ වශයෙන් හඳුනාගත හැකිය. එනම් අදින් වසර දෙදාස් දෙසිය අනූවකට (2290 BP) ඉහත දී තැන්පත් කරන ලද්දක් වශයෙන් කාබන් කාලනිර්ණය ක්‍රමය මගින් තහවුරුකොට තිබේ (සුමංගල, 2024: 85-97). පබළු වලට අමතරව මෙහි තිබී කොණ්ඩේ ගසන ලෝහමය කොණ්ඩ කූරක් ද හමුවිය. ප්‍රධාන බඳුන සහ එහි අභ්‍යන්තරයේ තැන්පත් කර තිබූ දෑ වලට අමතරව පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු වෙනත් කිසිවක් මින් හමු නොවීය. එහෙත් අංක 01 සුසාන ස්මාරකයේ අභ්‍යන්තරික තත්වය අංක 03 සුසාන ස්මාරකයට වඩා හාත් පසින් වෙනස් වූ තත්වයක් නිරීක්ෂණය විය. මෙහි ප්‍රධාන සුසාන ද්‍රව්‍ය තැන්පත් කළ බඳුනට අමතරව විවිධ හැඩයේ සහ ප්‍රමාණයේ බඳුන් විශාල ප්‍රමාණයක් මින් හමු විය. ඒවා හමු වූ ස්ථර පිළිබඳව අවධානය යොමු කිරීමෙන් පෙනීයන්නේ විවිධ අවස්ථාවල දී තැන්පත් කරන ලද ඒවා බවය. ඇතැම් කුඩා බඳුන් සුසාන චාරිත්‍ර සඳහාම නිර්මාණය කරන ලද බඳුන් වේ. විවිධ අවස්ථාවල දී මියගිය පුද්ගලයා සිහිපත් කොට විවිධ පුදපූජා පවත්වා ඇති බව මින් පැහැදිලි වේ. සොහොන් ස්මාරක දෙකින් හමු වූ පබළු ප්‍රධාන සොහොන් ද්‍රව්‍ය තැන්පත් කළ බඳුනෙන් හමු වීම සහ කොණ්ඩ කූර යන සාධක ද්විත්වය පිළිබඳව සලකා බැලීමෙන් පැහැදිලි වනුයේ මේවා සුසාන ස්මාරකය අයත් පුද්ගලයා ජීවත් ව සිටිය දී පරිහරණය කරන ලද ඒවා වන බවය.

වගු අංක 03

පබලු විශ්ලේෂණ සටහන 2020/KATU/BU 01

2290 BP

සොහොන් ස්මාරක අංක 03

| අනු අංකය | දිග (මි.මී) | විෂ්කම්භය (මි.මී) | බර **g** | සිදුරේ විෂ්කම්භය (මි.මී) | අමුද්‍රව්‍ය | නිෂ්පාදන ක්‍රමවේදය | වර්ණය | නිෂ්පාදන මාධ්‍යය | මතුපිට දීප්තිමත් භාවය | විනිවිද භාවය | සිදුරු කිරීම | විස්තරය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 15.42 | 4.45 | 1.167 | 1.4 | කානේලියන් | Cut, Chipped ground | තැඹිලි | පාෂාණ | දීප්තිමත් | තරමක් විනිවිද පෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයේ පවතියි. |
| 02 | 6.78 | 7.73 | 0.635 | 1.4 | ඇගේට් | Cut, Chipped ground | දුඹුරු | පාෂාණ | දීප්තිමත් | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයේ පවතියි. |
| 03 | 7.28 | 7.36 | 0.600 | 1.4 | කානේලියන් | Cut, Chipped ground | තැඹිලි | පාෂාණ | දීප්තිමත් | තරමක් විනිවිද පෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයේ පවතියි. |

පබලු විශ්ලේෂණ සටහන 2020/KATU/BU 02

2260 BP

සොහොන් ස්මාරක අංක 01

| අනු අංකය | දිග (මි.මී) | විෂ්කම්භය (මි.මී) | බර **g** | සිදුරේ විෂ්කම්භය (මි.මී) | අමුද්‍රව්‍ය | නිෂ්පාදන ක්‍රමවේදය | වර්ණය | නිෂ්පාදන මාධ්‍යය | මතුපිට දීප්තිමත් භාවය | විනිවිද භාවය | සිදුරු කිරීම | විස්තරය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 9.20 | 4.52 | 1.628 | 0.85 | කානේලියන් | Cut, Chipped ground | තැඹිලි | පාෂාණ | දීප්තිමත් | තරමක් විනිවිද පෙනේTrns lucnt | එක් පැති | මතුපිට පලුදු සහිත බැරල් හැඩැති හොඳ පබලුවකි. |
| 02 | 11.09 | 3.91/ 4.71 | 0.755 | 0.79 | කානේලියන් | Cut, Chipped ground | තැඹිලි | පාෂාණ | දීප්තිමත් | තරමක් විනිවිද පෙනේ | එක් පැති | මතුපිට පලුදු සහිත බැරල් හැඩැති හොඳ පබලුවකි. |
| 03 | 11.09 | 3.91/ 4.71 | 0.755 | 0.79 | කානේලියන් | Cut, Chipped ground | තැඹිලි | පාෂාණ | දීප්තිමත් | තරමක් විනිවිද පෙනේ | එක් පැති | මතුපට පලුදු සහිත බැරල් හැඩැති හොඳ පබලුවකි. |
| 04 | 30.63 | 5.93 | 3.35 | 0.73 | කොරල් | Cut, Chipped ground | සුදු | කාබනික | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | සිදුරු හතරකින් යුතු මෙහි මතුපිට පලුදු වී ඇත |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 05 | 7.21 | 5.22 / 5.62 | 0.436 | 0.90 | කොරල් | Cut, Chipped ground | සුදු | කාබනික | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | මතුපිට පලුදු සහිත බැරල් හැඩැති හොඳ පබලුවකි. |
| 06 | 7.95 | 6.45 / 5.94 | 0.562 | 1.15 | කොරල් | Cut, Chipped ground | සුදු | කාබනික | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | එක් පැත්තක් කැඩී ගොස් ඇත. |
| 07 | 18.26 | 46.49 | 1.651 | 2.27 | කොරල් | Cut, Chipped ground | සුදු | කාබනක | අඳුරු | විනිවිද නොපෙනේ | දෙපැති | පබලුවේ බදෙහි පතුරක් ගැලවී ඇත. ඉරිතැලීම් කිහිපයක් දක්නට ලැබේ. |
| 08 | 19.94 | 6.18 /7.55 | 2.048 | 1.39 | පැහැදිලි තිරුවානා | Cut, Chipped ground | සුදු | පාෂාණ | වඩාත් දීප්තිමත් | විනිවිද පෙනේ | දෙපැති | පැති හයක් සහිත පබලුවේ එක් කෙලවරක් කැඩී ගොස් ඇත. |
| 09 | 29.38 | 6.28 / 6.10 | 2.769 | 2.70 | පැහැදිලි තිරුවානා | Cut, Chipped ground | සුදු | පාෂාණ | වඩාත් දීප්තිමත් | විනිවිද පෙනේ | දෙපැති | පැති හයක් සහිත පබලුවේ එක් කෙලවරක කුඩා කොටසක් කැඩී ගොස් ඇත. |
| 10 | 18.82 | 6.07 | 1.577 | 1.45 | වීදුරු | Cut, Chipped ground | සුදු | කෘතිම (Synthetic) | දීප්තිමත් | විනිවිද නොපෙනේ | දෙපැති | පැති හයක් සහිත පබලුවේ එක් කෙලවරක් කැඩී ගොස් ඇත. විශාල වශයෙන් ඉරිතැලීම් දක්නට ලැබේ. නිෂ්පාදන දුර්වල තාවය මීට හේතුවී ඇත. |
| 11 | 9.991 | 7.86 | 0.912 | 1.14 | කානේලියන් | Cut, Chipped ground | තැඹිලි | පාෂාණ | දීප්තිමත් | තරමක් විනිවිද පෙනේ | දෙපැති | පැති හයක් සහිත පබලුවේ කෙලවරවල් කැඩී ගොස් බද කොටස පමණක් ඉතිරිව ඇත. |
| 12 | 15.03 | 5.12 | 1.212 | 1.15 | කානේලියන් | Cut, Chipped ground | තැඹිලි | පාෂාණ | දීප්තිමත් | තරමක් විනිවිද පෙනේ | දෙපැති | බැරල් හැඩැකි පැති හයක් සහිත මෙම පබලුව කොටස් හතරකට කැඩී ගොස් ඇත. |
| 13 | 19.12. | 5.07 /5.14 | 1.44 | 1.60 | පැහැදිලි තිරුවානා | Cut, Chipped ground | කිරි පැහැ තිසුදු | පාෂාණ | වඩාත් දීප්තිමත් | විනිවිද පෙනේ | දෙපැති | පැති හයක් සහිත බැරල් හැඩැති ඉතා හොඳ තත්වයේ |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **14** | 10.46. | 5.21 | 0.506 | 1.41 | විදුරු Glass frogme nts | Cut, Chipped ground | කිරි පැහැ තිසුදු | කෘතිම | දීප්තිමත් | විනිවිද නොපෙනේ Opaqve | දෙපැති | පැති හයක් සහිත බැරල් හැඩැති මෙම පබලුව කොටස් කිහිපයකට කැඩී ගොස් ඇත. |
| **15** | 6.67 | 4.95 /5.05 | 0.336 | 1.69 | කොරල් | Cut, Chipped ground | කිරි පැහැ තිසුදු | කාබනික | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයේ පවතින පබලුවකි. |
| **16** | 7.21 | 5.78/5.66 | 0.371 | 1.32 | කොරල් | Cut, Chipped ground | කිරි පැහැ තිසුදු | කාබනික | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | බැරල් හැඩැති මෙම පබලුවේ එක් කෙළෙවරකින් කුඩා පතුරක් ගැලවී ගොස් ඇත. |
| **17** | 1.11 | 3.65 | 0.017 | 1.26 | විදුරු | එතීමේ ක්‍රමය | සුදු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයේ පබලුවකි. |
| **18** | 0.97 | 3.98 | 0.024 | 1.32 | විදුරු | එතීමේ ක්‍රමය | | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයේ පබලුවකි. |
| **19** | 0.75 | 3.63 | 0.015 | 0.92 | විදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **20** | 0.90 | 3.49 | 0.015 | 1.25 | විදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **21** | 1.00 | 4.08 | 0.023 | 1.22 | විදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **22** | 1.00 | 4.11 | 0.025 | 1.23 | විදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **23** | 0.81 | 3.67 | 0.022 | 1.28 | විදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **24** | 1.18 | 3.74 | 0.022 | 1.19 | විදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **25** | 0.91 | 3.66 | 0.021 | 1.22 | විදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **26** | 1.09 | 3.69 | 0.022 | 1.23 | විදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **27** | 0.85 | 3.63 | 0.019 | 1.27 | විදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **28** | 0.91 | 3.67 | 0.020 | 1.32 | විදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | පබළුවකි. |
| **29** | 1.18 | 3.64 | 0.022 | 1.52 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **30** | 0.90 | 3.66 | 0.018 | 1.35 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **31** | 1.01 | 3.55 | 0.019 | 1.58 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළු වකි. |
| **32** | 0.90 | 3.62 | 0.017 | 1.34 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **33** | 1.03 | 3.64 | 0.019 | 1.28 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **34** | 1.02 | 3.68 | 0.021 | 1.24 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **35** | 0.91 | 3.61 | 0.018 | 1.24 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **36** | 0.95 | 3.82 | 0.021 | 1.26 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **37** | 1.78 | 3.63 | 0.013 | 1.44 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **38** | 1.99 | 3.73 | 0.016 | 1.27 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **39** | 1.94 | 3.59 | 0.019 | 1.27 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **40** | 0.92 | 3.68 | 0.018 | 1.29 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **41** | 0.98 | 3.67 | 0.019 | 1.34 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **42** | 1.12 | 3.65 | 0.020 | 1.54 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| **43** | 0.89 | 3.60 | 0.017 | 1.43 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | Disc වර්ගයේ පබළුවකි |
| 52 | 0.87 | 3.71 | 0.019 | 1.33 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| 53 | 0.86 | 3.64 | 0.018 | 1.25 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| 54 | 0.80 | 3.56 | 0.016 | 1.27 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| 55 | 0.90 | 3.66 | 0.019 | 1.46 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| 56 | 0.96 | 3.69 | 0.019 | 1.46 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |
| 57 | 0.94 | 3.86 | 0.022 | 1.30 | වීදුරු | එතීමේ ක්‍රමය | දුඹුරු | කෘත්‍රිම | අඳුරු | විනිවිද නොපෙනේ | එක් පැති | ඉතා හොඳ තත්වයෙන් යුතු Disc වර්ගයේ පබළුවකි. |

**සමාලෝචනය**

කටුපොත මෙගලිතික සුසාන පර්යේෂණ කැණීමේ කාබන් කාලනිර්ණය සහිත (2260 BP, 2290 BP) අංක 01 සහ 03 යන සුසාන ස්මාරකවලින් ලබා ගත් පබළු මෙම පර්යේෂණය සඳහා භාවිත කළේය. අංක 01 සුසාන ස්මාරකය නිර්මාණය කොට ඇති ආකාරය සහ එහි තැන්පත්කොට තිබූ සුසාන ද්‍රව්‍ය පිළිබඳව අවධානය යොමු කිරීමෙන් මෙහි යම් විශේෂත්වයක් තිබෙන බව පැහැදිලි වේ. සුසාන ස්මාරකයේ උතුරු පැතිගල ගල් පතුරු දෙකක් යොදාගනිමින් නිර්මාණය කොට තිබුණි. ඒ අනුව උතුරු පැතිගල, සුසාන ස්මාරකයට යම් යම් දෑ ඇතුල් කිරීම සඳහා වූ දොරටුවක් ලෙස භාවිත කොට ඇති බව තහවුරු විය. සුසාන අභ්‍යන්තරයේ විවිධ ස්තර වලින් හමු වූ මැටි බඳුන් සහ උතුරු පැතිගල කොටස් දෙකකින් යුක්ත වීම යන කරුණුවලින් පෙනීයන්නේ විවිධ අවස්ථා වලදී මියගිය පුද්ගලයා සිහිකොට පුද පූජා පවත්වා යම් යම් දෑ සුසානය තුළට දමා ඇති බවය. තවද මින් හමු වූ පබළු අනෙක් සුසාන ස්මාරකයෙන් හමුවූ පබළුවලට වඩා හැඩයෙන්, ප්‍රමාණයෙන් සහ අමුද්‍රව්‍යයන්ගේ විවිධත්වයක් දක්නට ලැබුණි. ඒ අනුව මෙම සොහොන් ස්මාරකය එකල සමාජයේ ප්‍රභූ පුද්ගලයෙකුට අයත් සොහොන් ස්මාරකයක් වශයෙන් පිළිගත හැකිය. අංක 03 සොහොන් ස්මාරකයෙන් හමු වූයේ මැටි බඳුන් තුනක් සහ වීදුරු, ඇගේට් යන අමුද්‍රව්‍යයන්ගෙන් නිෂ්පාදිත පබළු තුනක් පමණි. මේවායේ බාහිර රූප විද්‍යාත්මක ලක්ෂණ අනුව මේවා අත් පළඳනා වශයෙන් භාවිත කරන්නට ඇතැයි සිතිය හැකිය. එකල සමාජයේ සෑම පුද්ගලයෙකුම එක හා සමාන අයුරින් පළඳනා පරිහරණය කොට නොමැති අතර පුද්ගල තරාතිරම අනුව එහි වෙනස්කම් තිබූ බව මින් පැහැදිලි වේ.

පූර්ව ඓතිහාසික යුගයේ පැවති මෙම සුසාන සම්ප්‍රදාය ඓතිහාසික යුගයේ ආරම්භක කාල පරාසය දක්වාම පැතිර පැවති බව මෙම පර්යේෂණයට අදාළ පුරාවිද්‍යාත්මක දත්තවලින් තහවුරු වේ. එකල සමාජයේ ආගමික සහ ලෞකික අවශ්‍යතාවන් උදෙසා පබළු නිෂ්පාදනය සහ භාවිතය පැවතුනි. සුසාන ස්මාරක වලින් හමු වූ පබළු සහ බඳුන් වර්ග වල ප්‍රමාණය සහ විවිධත්වය අනුව

ඒවා අයත් වන පුද්ගලයන්ගේ ප්‍රභූත්වය සහ සමාජීය තත්වය පිළිබඳ අදහසක් ලබාගත හැකිය. තවද මෙම පර්යේෂණය සඳහා භාවිත කළ පබළු එකතුවේ වීදුරු පබළු ප්‍රමාණය වැඩි වීමෙන් පෙනීයන්නේ ක්‍රි.පූ. හතරවන සියවස වන විට පහළ මල්වතුඔය නිම්නයේ වීදුරු පබළු නිර්මාණ තාක්‍ෂණය දියුණු මට්ටමක පැවති බවය. මෙගලිතික සංස්කාතිය තුළ ජීවත් වූ අතීත මානවයාගේ සුසාන චාරිත්‍ර මෙන්ම පබළු නිෂ්පාදන තාක්‍ෂණයේ ස්වභාවය පිළිබඳ යම් අදහසක් ලබා ගැනීම සඳහා උක්ත පුරාවිද්‍යාත්මක දත්තයන් බෙහෙවින් වැදගත් වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


අකුරැටියේ අමරවංශ නාහිමි සහ හේමචන්ද්‍ර දිසානායක (සංස්) (2001) *වංසත්ථප්පකාසිනි*. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පාකර්, එච්. (1984) *තිස්සමහාරාම පුරාවිද්‍යාව*. පරිව. එච්.ඒ.පී. අභයවර්ධන. කොළඹ.

පොන්නම්පෙරුම, (1961) *විදේශීන් දුටු පුරාණ ලංකාව*. මහනුවර: ආර්ය මුද්‍රණාලය.

මැන්දිස්, තුසිත ඩී. (2019) *පුරාණ අනුරාධපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය*. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ලංකානන්ද හිමි (සංස්), එල්. (1960) *බුත්සරණ*. කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

සරණංකර හිමි, ජී. (1959) *ථූපවංසය*. කොළඹ: රත්න පොත් වෙළෙඳ සමාගම.

හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාව (සංස්) (1998) *මහාවංශය*. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

Adikari, G. (2009), *Hunting for Hunter Gatherers at Alavala Cave, Symposium on New Discoveries from the Excavation at Alavalb 3rd November 2009*, PGIAR Pubication.

Beck, H.C. (1928), *Classification and Nomenclature of Beads and Penddanis in Archaeoloyia or Miscellaneous tr acts relating to Antiquary*, Second Series, vol.28, Oxford.

Bndaranayake, (1986), *The Rock and Wall Paintings of Sri Lanka*, Colombo.

Dearaniyagala, S.U. (2007), *The Prehistory And Proto History of Sri Lanka, The Art and Archaeology of Sri Lanka*, Central Cultural Fund, Ministry of Cultural Affairs. 1-96,pp

Deraniyagala, (1972), *The Citadel of Anuradapura 1969: Excavations in the Gedige Area*. Ancient Ceylon. 2: 165.

*Encyclopeadia Americana*, (1978), New York.

Francis, P (2002), *Asia's Maritime Bead Trade: 300 B.C. to the Present*. Honolulu: University of Hawai Press.

Hannibl, A.S.D. (2001), *Beads form Tissamaharama; A Typology of Sri Lankan Glass and semi-precious stone Beds, Ancient Ruhuna*, vol.1, Sri Lankan-German Archaeological Project in Southern Province (eds). Weisshar, H.J.H Rothi, W.Wijayapala: 203-294pp.

Perera, H. N. (2010), *Prehistoric Sri Lanka, Late Pleistocene Rock Shelters and an Open air site*. BAR International Series.

Seneviratne, S. (1984), *The archaeology of the Megalithic – Black and Red Ware Complex in Sri Lanka. Ancient Ceylon*. 5: 237-307.